# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2024 අප්‍රේල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2024 අප්‍රේල් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 2.7%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2024 මාර්තු මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2.5%ක් ලෙස වාර්තා විය. 2024 අප්‍රේල් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 1.4% ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.3%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 මාර්තු මාසයේදී 5.0% සිට 2024 අප්‍රේල් මාසයේ 3.3% දක්වා අඩු වී ඇති අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 මාර්තු මාසයේදී 0.7% සිට 2024 අප්‍රේල් මාසයේදී 2.3% දක්වා වැඩි වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2024 මාර්තු මාසයේ 210.0ක් වූ දර්ශකාංකය, 2024 අප්‍රේල් මාසයේ දී 208.2 ක් දක්වා අඩු වී ඇති බව වාර්තා විය. මෙය 2024 මාර්තු මාසයට සාපේක්ෂව 2024 අප්‍රේල් මාසයේ දර්ශකාංකය 1.8ක අඩුවීමක් එනම් 0.89 ක ප්‍රතිශතාංක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩය 0.60% කින් අඩුවීම සහ ආහාර නොවන කාණ්ඩය 0.29% කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට මිලෙහි අඩුවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත්තේ එළවළු, අමුමිරිස්, බිත්තර, වියළි මිරිස්, කිරිපිටි, අර්තාපල්, සහල්, කරවල, සීනි,ටින්මාළු, කව්පි, මයිසූර් පරිප්පු, මිරිස් කුඩු, කඩල සහ අලුත් පළතුරු යන ආහාර ද්‍රව්‍යවල වේ. එහෙත් ලොකු ළූණු,දෙහි, කුකුලු මස් ,පොල්,තේ කුඩු/කොළ, අලුත් මාළු, මුං ඇට, ඉගුරු සහ රතු ළූණු යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කළ විට, 2024 අප්‍රේල් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා 'නිවාස,ජලය,විදුලිය,ගෑස් හා වෙනත් ඉන්ධන' *(විදුලි බිල සහ එල්.පී ගෑස්)* සහ 'විනෝදාත්මක සහ සංස්කෘතික'(අභ්‍යාස පොත් සහ ලිපි ද්‍රව්‍ය) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත් ප්‍රවාහන (ත්‍රීරෝද රථ ගාස්තු),'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය'(බුලත් කොළ),'සෞඛ්‍ය'(පෞද්ගලික වෛද්‍ය ගාස්තු) 'විවිධ භාණ්ඩ සහ සේවා' සහ 'රෙදිපිළි සහ පාවහන්'(රෙදිපිළි) කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවිමක් වාර්තා වී ඇත. තව දුරටත් සළකා බැලීමේදී 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ 'ආපන ශාලා සහ හෝටල්' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. මේ අතර 'සංනිවේදන' සහ 'අධ්‍යාපන' කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පාද වර්ෂය: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්ඡාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2024 මාර්තු මාසයේ 3.4% සිට 2024 අප්‍රේල් මාසයේදී 3.0% දක්වා අඩුවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2023** | අප්‍රේල් | 202.7 | 223.8 | 189.1 | 188.2 | -1.0 | 0.1 | 33.6 | 27.1 | 39.0 | 31.8 |
| | මැයි | 203.1 | 226.1 | 188.3 | 187.8 | 0.2 | -0.2 | 22.1 | 15.8 | 27.6 | 21.6 |
| | ජූනි | 203.3 | 228.4 | 187.1 | 186.5 | 0.1 | -0.7 | 10.8 | 2.5 | 18.3 | 11.3 |
| | ජූලි | 201.9 | 227.5 | 185.3 | 188.0 | -0.7 | 0.8 | 4.6 | -2.5 | 10.9 | 6.3 |
| | අගෝ. | 201.9 | 224.6 | 187.3 | 188.7 | 0.0 | 0.4 | 2.1 | -5.4 | 9.0 | 4.1 |
| | සැප්. | 203.5 | 226.7 | 188.5 | 189.0 | 0.8 | 0.2 | 0.8 | -5.2 | 5.9 | 1.7 |
| | ඔක්. | 203.6 | 224.1 | 190.4 | 189.2 | 0.0 | 0.1 | 1.0 | -5.2 | 6.3 | 0.6 |
| | නොවැ. | 206.0 | 228.1 | 191.8 | 189.3 | 1.2 | 0.1 | 2.8 | -2.2 | 7.1 | 0.8 |
| | දෙසැ. | 208.8 | 236.2 | 191.2 | 189.7 | 1.4 | 0.2 | 4.2 | 1.6 | 6.3 | 0.9 |
| **2024** | ජන. | 215.0 | 242.4 | 197.3 | 193.9 | 3.0 | 2.2 | 6.5 | 4.1 | 8.5 | 2.2 |
| | පෙබ. | 214.5 | 239.5 | 198.3 | 194.6 | -0.2 | 0.4 | 5.1 | 5.0 | 5.1 | 2.7 |
| | මාර්තු | 210.0 | 234.4 | 194.3 | 194.5 | -2.1 | -0.1 | 2.5 | 5.0 | 0.7 | 3.4 |
| | අප්‍රේල් | 208.2 | 231.1 | 193.4 | 193.9 | -0.9 | -0.3 | 2.7 | 3.3 | 2.3 | 3.0 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව